ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2014

8 ශ්‍රේණිය - ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

I වන පත්‍රය කාලය: පැය 1/2

ලකුණු 40 යි (2 × 20)

නම / විභාග අංකය - ..............................................................................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ **නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

(01) "ඔව් මට පුළුවන්, මම ජය ගනිමි" මේවා ..........................

(1) සුභවාදී සිතුවිලිය (2) අසුභවාදී සිතුවිලිය

(3) නිදහස් සිතුවිලිය (4) තරඟකාරී සිතුවිලිය

(02) ගැටුම් වළක්වාගත හැකි ක්‍රමවේදයක් වන්නේ

(1) හඬ නගා කෑ ගැසීම (2) අනවබෝධයෙන් කටයුතු කිරීම

(3) අනික් පාර්ශවයට ඇහුම්කන් දීම (4) හිතුමතේට කටයුතු කිරීම

(03) විශ්මිත නිර්මාණ අතර ලොව අටවන පුදුමය ලෙස සලකන්නේ,

(1) චීනමහා ප්‍රාකාරය (2) ටජ්මහල (3) රතු බලකොටුව (4) සීගිරිය

(04) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණයක් වන්නේ

(1) සාරධර්ම පිටුදැකීම (2) වැඩිදෙනාගේ කැමැත්තට ගරු කිරීම

(3) ධන බලයට යටත්වීම (4) පෞද්ගලික තීරණවලට එළඹීම

(05) පොදු සේවා සපයන ආයතනයක් නොවන්නේ

(1) රෝහල (2) උපකාරක පන්ති

(3) තැපැල් දෙපාර්තමේන්තුව (4) ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය

❖ පහතින් දැක්වෙන ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

**(සාර්ක්, ප්‍රජාතන්ත්‍රවාදී, උඩඟුබව, විදුලිබලය, මිත්‍රශීලිබව, සර්ව සුභවාදී, යුනිසෙෆ්, පළාත්, පානීය ජලය, කොට්ඨාස)**

(06) .............................. හොඳ නායකත්ව ගුණාංගයකි.

(07) මහජනයා විසින් මහජනතාවගේ යහපත උදෙසා කරනු ලබන පාලන ක්‍රමය

.............................. පාලන ක්‍රමය ලෙස හඳුන්වයි.

(08) ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා කටයුතු කරන ජාත්‍යන්තර සංවිධානයකි

..............................

(09) ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට .............................. සපයනු ලබන්නේ ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයයි.

(10) ඔබ ප්‍රදේශයේ පාසල්වල කටයුතු වඩාත් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා සහය වන සමීපතම ආයතනය වන්නේ .............................. අධ්‍යාපන කාර්යාලයයි.

**අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර "ආ" කොටසින් තෝරා තිත් ඉර මත ලියන්න.**

| (අ) | (ආ) |
|---|---|
| (11) මනස දියුණු කරගත් උසස් කරගත් පුද්ගලයා මනුෂ්‍යයාය .................. | 1. හැරී එස්. ට්රූමන් |
| (12) සිතින් දිළින්දෝ භාග්‍යවන්තයෝය ......... | 2. අනගාරික ධර්මපාලතුමා |
| (13) අනුගාමිකයන් ලවා නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීමටත්, ඔවුන් නොකළ යුතු දෑ මෙහෙයවීමත් නායකත්වයකින් අපේක්ෂා කරයි ............... | 3. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා |
| (14) ගව ඝාතනයට එරෙහිව හා බුද්ධගයාව බේරා ගැනීමට සාමකාමීව සටන් ව්‍යාපාර මෙහෙයවීම .................. | 4. ජේසුස් වහන්සේ |
| (15) "ජාතික සංවර්ධනය ජාතික සංස්කෘතියෙහි ප්‍රතිබිම්බයයි" ............... | 5. බුදුරජාණන් වහන්සේ |

❖ **පහත දැක්වෙන ප්‍රකාශන හරිනම් (√ ) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙන් දක්වා ඇති වරහන තුළ යොදන්න.**

(16) ශ්‍රී ලංකාව බහු සංස්කෘතියක් ඇති රටකි. ( )

(17) යහපත් පුරවැසියකු ලෙස සමාජයට පිවිසෙන පුද්ගලයා සමාජයේ නීතිරීති පිළිබඳ අවබෝධයකින් සිටිය යුතු නොවේ. ( )

(18) ආදර්ශවත් චරිත කතා යහපත් සිතුවිලි පෝෂණය කරයි. ( )

(19) සෑම රැකියාවක් ම සමාජයේ ක්‍රියාකාරීත්වය සඳහා හේතු නොවේ. ( )

(20) පහසු මිලට පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි කිරීම සමුපකාරය මගින් කෙරෙන සේවාවකි. ( )

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2014
ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය
8 ශ්‍රේණිය - II වන පත්‍රය

කාලය : පැය 1 1/2 යි
මුළු ලකුණු - 60 යි

නම / විභාග අංකය - ..............................................................................

❖ පළමු ප්‍රශ්නය අනිවාර්යයි.
❖ තවත් ප්‍රශ්න 4 ට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.

1. "බහු සංස්කෘතික ජන සමාජයක අංග ලක්ෂණ" යන නිපුණතාව යටතේ දෙවන වාර අවසාන ඇගයීම සඳහා නියමිත ක්ෂේත්‍ර චාරිකාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) බහු සංස්කෘතික ජන සමාජයක ජීවත්වන යහපත් පුරවැසියකු සතුවිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. (ල. 2 යි)
   (ii) බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ල.2 යි)
   (iii) ඔබ විසින් ක්ෂේත්‍ර චාරිකාව සඳහා යොදාගත් ආගමික සිද්ධස්ථාන තුනක් සඳහන් කරන්න. (ල. 3 යි)
   (iv) ක්ෂේත්‍ර චාරිකාව සංවිධානය කිරීමේදී නායකයකු වශයෙන් ඔබට පැවරුණු වගකීම් දෙකක් හා ඔබට මුහුණ පෑමට සිදු වූ ගැටළු දෙකක් සඳහන් කරන්න. (ල. 4 යි)
   (v)
   - බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු උත්සව 2 ක්
   - හින්දු සංස්කෘතිය හා බැඳුණු උත්සව 1 ක්
   - ක්‍රිස්තියානි සංස්කෘතිය හා බැඳුණු උත්සව 1 ක්
   - ඉස්ලාම් සංස්කෘතිය හා බැඳුණු උත්සව 1 ක් ද බැගින් සඳහන් කරන්න. (ල. 1X 5 = 5) (මුළු ලකුණු 16 යි)

2. (i) ශරීරයේ ඇතිවන හැසිරීම් රටා 04 ක් පහතින් දැක්වේ. ඒවාට ගැළපෙන චිත්තවේගය ඉදිරියෙන් ලියා දක්වන්න.
   1. රැවීම -
   2. විලාප දීම -
   3. ඇස් විශාල වීම -
   4. උඩ පැනීම - (ල.$\frac{1}{2}$ X 4 = 2 යි)

   (ii) අපට දැනෙන චිත්තවේග යහපත් අයුරින් ප්‍රකාශ කළ හැකි ආකාර හතරක් ලියා දක්වන්න. (ල. 1 X 4 = 4 යි)
   (iii) පාසල් ශිෂ්‍යයන් වශයෙන් නියමිත වේලාවට අවදි නොවීම හේතුවෙන් ඔබට මුහුණ පෑමට සිදුවන අපහසුතා 5 ක් සඳහන් කරන්න. (ල. 1X 5 = 5 යි)

(මු. ල. 11 යි)

3. (i) ගැටුමක් ප්‍රචණ්ඩකාරී ගැටුමක් බවට පරිවර්තනය වීම සඳහා බලපාන හේතු 2 ක් ලියන්න. (ල. 1X 2 = 2 යි)

(ii) ගැටුම් වළක්වා ගැනීමේ ක්‍රමවේද 4 ක් ලියන්න. (ල. 1X 4 = 4 යි)

(iii) 1. ගැටුමක අවසන් ප්‍රතිඵල තුනකි. ඒවා ලියා දක්වන්න. (ල. 1X 3 = 3 යි)

2. එම ප්‍රතිඵල අතුරින් වඩාත් ම යහපත් ප්‍රතිඵලය කුමක් ද? (ල. 2 යි)

(මු.ල. 11 යි)

4. (i) නායකත්ව ගුණාංග 4 ක් ලියා දක්වන්න. (ල. $\frac{1}{2}$ X 4 = 2 යි)

(ii) A - තමා බලාපොරොත්තු වන්නේ "හැම ඇසකම ඇති හැම කඳුළු බිඳක් ම පිස දැමීමයි" මේ කියමන හා සම්බන්ධ නායකයා කවුද? (ල. 2 යි)

B - " අභිමානයෙන් යුක්තව පයින් ගමන් කිරීම, අවමානයෙන් යුක්තව බස්වල ගමන් කරනවාට වඩා ගෞරව සම්පන්නයි" මේ කියමන හා සම්බන්ධ නායකයා නම් කරන්න. (ල. 2 යි)

(iii) A - දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදය පිටු දැකීම සඳහා සටන් වැදුණු නායකයා නම් කරන්න. (ල. 1 යි)

B - නිජබිමේ ස්වාධීනත්වය වෙනුවෙන් කැපවූ රතු ඉන්දීය නායකයා කවුද? (ල. 1යි)

C - ශ්‍රී ලංකාවේ නිදහස් ව්‍යාපාරය වෙනුවෙන් සටන් වැදුණු නායකයින් තිදෙනෙක් පහත සඳහන් ශීර්ෂ යටතේ ලියා දක්වන්න. (ල. 1X3 = 3 යි)

සිංහල -

දමිළ -

මුස්ලිම් - (මු.ල. 11 යි)

5. (i) රැකියාවක් ලෙස සිදුකරන සේවාවන් දෙකකට උදාහරණ සපයන්න. (ල. 1X 2 = 2 යි)

(ii) අධ්‍යාපන සේවාව යටතේ පාසලක කාර්ය මණ්ඩලයට අයත්වන කොටස් 4 ක් නම් කරන්න. (ල. 1X 4 = 4 යි)

(iii) ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර පහක් සඳහන් කරන්න. (ල. 1X 5 = 5 යි)

6. (i) ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක දක්නට ඇති ප්‍රධාන අංග දෙකක් ලියා දක්වන්න. (ල.1X 2=2 යි)

(ii) පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රීය ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ල. 1X 4 =4 යි)

(iii) ළමයෙකු වශයෙන් හිමිවන අයිතිවාසිකම් දෙයක් සඳහන් කර ඔබ සතු යුතුකමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5 යි)

7. (i) පොදු සේවා සපයන ආකාරය අනුව බෙදා ඇති කොටස් තුනෙන් දෙකක් නම් කරන්න. (ල. 2 යි)

(ii) පොදු සේවාවල මූලික ලක්ෂණ 4 ක් ලියන්න. (ල. 1X 4 = 4 යි)

(iii) පොදු සේවාවන් ප්‍රයෝජනයට ගන්නා පුරවැසියකු සතු වගකීම හා යුතුකම් එක් පොදු සේවාවක් යටතේ කෙටි විස්තරයක් කරන්න. (ල. 5 යි)